# රටට වැඩක් කළ හැකි අයෙක් මන්ත්‍රී ධුරයට පත්කර ගන්න

## පැෆරල් විධායක අධ්‍යක්ෂ

චමින්ද සිල්වා

මහ මැතිවරණයේදී රුපියල් කෝටි පහමාරක් වැයකර තෝරා ගන්නා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා රටට වැඩක් කළහැකි යැයි සිතෙන කෙනෙක් පත්කර ගන්න යැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ඊයේ (02 දා) ජනතාවගෙන් ඉල්ලීමක් කළේය.

මහ මැතිවරණයට ඉදිරිපත් වී සිටින ප්‍රධාන පක්ෂ ඇතුළු බොහෝ පක්ෂවල පොරොන්දු ලබාදීම් මෙවරත් දක්නට ලැබෙන බවත්, දෙනවයි කියන එම පොරොන්දුවලට වඩා පත්වන මන්ත්‍රීවරයාට රටේ නීති සම්පාදනය, ප්‍රතිපත්ති සකස් කිරීම සහ මූල්‍ය පාලන සම්බන්ධයෙන් දායකවිය හැකිද යන්න සොයා බලන ලෙසත් හෙට්ටිආරච්චි මහතා කීය.

සෑම පුරවැසියකුම සිය ඡන්දය භාවිතා කිරීමට පෙර ඒ ඒ අපේක්ෂකයන් අල්ලසට, දූෂණයට, රාජ්‍ය දේපළ අවභාවිතය ඇතුළු අක්‍රමිකතාවලට සම්බන්ධයක් නැති පිරිස් පිළිබඳව නිවස තුළ හෝ සාකච්ඡා කර ඒවා නොමැති අයට ඡන්දය ලබාදීමටත් එවැනි අය නොමැති නම් අවමය තිබෙන අය හෝ තෝරා ගැනීමට කටයුතු කළයුතු බවත් ඒ මහතා අවධාරණය කර සිටියේය.

ඡන්දය ලබාදෙන සෑම පුරවැසියකුම තමන් පත්කරන මන්ත්‍රීවරයා වසර 05 ක කාලයකට පත්කරන බවට නොසිතන ලෙසත් තමන් පත්කරන වසර පහ තුළ ඔහු රට වෙනුවෙන් ගන්නා තීන්දු තීරණ රටේ අනාගත පැවැත්ම තීරණය කරන බව සෑම පුරවැසියකුම අවබෝධ කරගත යුතු බවත් රෝහණ හෙට්ටිආරච්චි මහතා වැඩිදුරටත් පැවසීය.